## අලව්ව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ප්‍රමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු (කොන්ත්‍රාත් පදනම) | 02 | රා. ප. ච. ලේ. 3/2016 PL 3-2016 25790-10x270-10x300-10x330-12x350- රු. 38,990 (රා.ප.ච.ලේ. 3/2016 අනුව වැටුප් ගෙවනු ලැබේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය. |

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරු අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර (03) නොඅඩු කාලයක් අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. (ඡන්දහිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ විය යුතුය)

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

(දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iv) භාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

(v) රජයේ ආයතනයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් වෘත්තිය පුහුණුව පිළිබඳව අනුමත සහතිකයක් ලබා තිබිය යුතුය.

(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය.

(vii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් , වාචික පරීක්ෂණයක හා ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

05. *සේවය නියුක්තයකු වීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීමක් වන අතර, අවම වශයෙන් වසර 02ක සේවා කාලයක් සඳහා ගිවිසුමකට යටත් වේ.

(ii) මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසි වලටද, මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා



කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද, අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුය.

06. *අයදුම්පත ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2019.04.16 හෝ එදිනට පෙර ''ලේකම්, අලව්ව ප්‍රාදේශීය සභාව, අලව්ව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුර සඳහන් කල යුතුය.

(iii) අයදුම්පත සමග ඉහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපන සහතිකය ;
(ඇ) අස්වීමේ සහතිකය ;
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.) ;
(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
(ඊ) වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමකින් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල සහ මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

කේ. ආර්. පී. ජී. ආර්. කරුණානායක,
ලේකම්,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

2019 මාර්තු මස 15 වැනි දින,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.

**අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම - 2019**

...........................................................තනතුර සඳහා අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග:——————————

02. මුලකුරු වලින් හැඳින්වෙන නම:——————————

03. ස්ථිර ලිපිනය:——————————

04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:——————————

05. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————

06. දිස්ත්‍රික්කය:——————————

07. උපන්දිනය:

වර්ෂය:————— මාසය:————— දිනය:—————

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————— මාස :————— දින:—————

09. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන් ද යන වග:——————————

11. විවාහක/අවිවාහක යන වග:——————————



12. ජාතික හැඳුනුම්පත් අංකය:——————————

13. අධ්‍යාපන සුදුසුකම්:——————————

14. වෘත්තීය හා වෙනත් සුදුසුකම්:——————————

15. සේවා පළපුරුද්ද:——————————

(අ) දැනට සේවය කරන ආයතනය:——————————
(ආ) දැනට දරන තනතුර:——————————
(ඇ) එම තනතුරට පත්වූ දිනය:——————————
(ඈ) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන තනතුර :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————————;
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————.

*දැනටමත් රාජ්‍යසේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ..............................................................................මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:—————.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

03-844

Source: Government Gazette (2019.03.15)